ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
**කොළඹ**

පුවත්පත් නිවේදනය

**<u>ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ ප්‍රදර්ශනය උඳුවප් පොහෝ දින ජය ශ්‍රී මහා බෝධි පරිශ්‍රයේදී පැවැත්වේ</u>**

ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් 11 වන වරටත් සංවිධානය කරන ලද ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ ප්‍රදර්ශනය උඳුවප් පුන් පොහෝ දින අනුරාධපුර ඓතිහාසික ශ්‍රී ජය මහා බෝධි විහාර සංකීර්ණයේදී පැවැත්විණ.

2. ඉන්දියාවේ පූජනීය ජය ශ්‍රී මහා බෝධි වෘක්ෂයේ ශාඛාවක් රැගෙන සංඝමිත්තා මහ රහත් තෙරණිය ශ්‍රී ලංකාවට වැඩම කරන ලද්දේ උඳුවප් පුන් පොහෝ දිනකදී ය. බුදුන් වහන්සේට බුද්ධත්වය ලබා ගැනීම සඳහා සෙවණ දුන් පූජනීය වෘක්ෂයේ ශාඛාවක් වන මෙම පූජනීය බෝධීන් වහන්සේ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ආධ්‍යාත්මික සහ සංස්කෘතින බැඳීමේ ජීවමාන සංකේතයක් වේ. මෙම උතුම් දිනයේදී ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ ප්‍රදර්ශනය අනුරාධපුරයේදී පැවැත්වීම දෙරට අතර දිගුකාලීන සබඳතාවය අවධාරණය කරන අතර දෙරට එක්කරන පොදු උරුමය ඉස්මතු කරයි.

3. බුද්ධ චරිතයේ වැදගත් අවස්ථාවන් සහ ඉන්දියාවේ විවිධ බෞද්ධ සිද්ධස්ථානවල ඡායාරූප රැසක් මෙම ප්‍රදර්ශනයට ඇතුළත් වේ. ඉන්දියාවේ පොහොසත් බෞද්ධ උරුමය පිළිබඳ මෙම ප්‍රදර්ශන මාලාව ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් මෙම වසරේ සෑම පොහෝ දිනකදීම දිවයින පුරා විවිධ විහාරස්ථානවල පවත්වන ලදී.

4. පැවති සෑම ප්‍රදර්ශනයක් සඳහාම ඉහළ ප්‍රතිචාරයක් හිමි වූ අතර බැතිමත්හු ප්‍රදර්ශනයේ ආධ්‍යාත්මික සහ සංස්කෘතික වැදගත්කම අගය කළහ.

***

**කොළඹ**
***2024*** *දෙසැම්බර්* ***14***